**දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------

දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන ආනයන බැංකුව අතර 2014 සැප්තැම්බර් 16 දින, 2014 දෙසැම්බර් 23 දින හා 2016 අප්‍රේල් 07 දින එළඹි අංක PBC අංක (2014 ) 27 Total අංක (321), PBC අංක (2015) 38 Total අංක (381), GCL අංක (2014) 17 Total අංක (520) සහ GCL අංක (2014) 18 Total අංක (521) දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට මහා මාර්ග , වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ මාතර සිට හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය කිලෝමීටර් 96 ක් දීර්ඝ කිරීමට හා ජාත්‍යන්තර ආයෝජන කේන්ද්‍රයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම සඳහා සහාය හා කාර්යයන් පහසුකරලීම සඳහා මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ බෙලිඅත්ත සිට මාතර, බෙලිඅත්ත සිට වැටිය, වැටිය සිට අන්දරවැව සහ මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට ආදී වශයෙන් කොටස් 04 කට වෙන්කර තිබුණි. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 250,936 කට සමාන එජඩො මිලියන 1,892 ක් වන අතර ඉන් රු. මිලියන 226,142 කට සමාන එජඩො මිලියන 1,708 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2014 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2020 ජනවාරි වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස්

නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම් හා ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ

ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 152.17 ක් වූ උපදේශක ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන් කරන ලද මුදල | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දක්වා |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| චීන අපනයන ආනයන බැංකුව | 1,348 | 174,760 | 14,804 | 14,803 | 14,803 |
| ශ්‍රීලංර | 121 | 15,725 | 6,373 | 6,213 | 6,282 |
| එකතුව | 1,469 | 190,485 | 21,177 | 21,016 | 21,085 |

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් හා ඉටු කර ගත යුතු මූල්‍ය හා භෞතික ඉලක්කයන් හඳුනා ගැනීම සඳහා විස්තරාත්මක සමස්ත සැලැස්මක් පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල

කළ යුතු වුවද, ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) මාතර සිට බෙලිඅත්ත දක්වා, වැටිය සිට අන්දරවැව දක්වා හා මත්තල සිට හම්බන්තොට දක්වා අධිවේගී මාර්ගයේ කොටස් 03 ක ඉදිකිරීම් වැඩ 2016 ජනවාරි මාසයේදී ආරම්භ කර තිබූ බවත්, ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයන්වල ප්‍රමාදයන් හේතුවෙන් බෙලිඅත්ත සිට වැටිය දක්වා අනෙක් අංශයේ ඉදිකිරීම් වැඩ 2016 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. රේඛීය අමාත්‍යාංශයෙන් ලැබුණු තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන ලද රජයේ ඉඩම් කොටස් 2,149 ක් ඇතුළත්ව ඉඩම් කොටස් 7,865 කින් 2015 දෙසැම්බර් 31 දිනට සියයට 45 ක ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු පමණක් නිම කර තිබුණි. කෙසේ වුවද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වල නිරතවූ නිලධාරින් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.මිලියන 9.86 ක දිරිදීමනා ගෙවා තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති නියාමන ඒකකය 2014 සැප්තැම්බර් මාසයේදී ස්ථාපිත කර තිබුණද, ව්‍යාපෘති අධ්‍යක්ෂවරු 04 දෙනෙකු, කණ්ඩායම් නායකයකු, ප්‍රසම්පාදන උපදේශකවරයකු, ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු , නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, මුදල් කළමනාකරුවකු හා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන් දෙදෙනෙකු යන ප්‍රධාන තනතුරු 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ නිලධාරින් 12 දෙනෙකු බඳවා ගැනීම සඳහා අනුමත කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ උපදේශකවරුන් 12 දෙනෙකු බඳවා ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. මාසිකව එක් නිලධාරියෙකුට රු.67,680 ක් වූ ඉන්ධන, ප්‍රවාහනය හා නේවාසික දීමනා ගෙවීමට ඉඩ ලැබෙන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09 / 2007/02(iv) හි විධිවිධාන පදනම් කර ගෙන එම පත්වීම් කර තිබූ බව නිරීක්ෂණය විය.

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

2014 අගෝස්තු දක්වා ව්‍යාපෘතිය විසින් පත්කරන ලද විදේශීය උපදේශකවරුන් පැමිණ නොමැති බවත් එහි ප්‍රතිඵලයක් ලෙස උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය නම් වූ වෙනත් ව්‍යාපෘතියක් සඳහා පත් කරන ලද දේශීය උපදේශකවරයෙකු ව්‍යාපෘතිය විසින් යොදවා තිබු බවත් නිරීක්ෂණය විය. ඒ සඳහා ගෙවන ලද රු. මිලියන 40 ක් වූ උපදේශක ගාස්තු එම ව්‍යාපෘතියට අයකර තිබුණි.